# බළන්ගොඩ නගර සභාව

## 2025.09.23 වන දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2025.09.23**

**වේලාව -පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති කේ. ජී පේමදාස මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | කේ. ජී පේමදාස මැතිතුමා |
| 2. ගරු උප සභාපති | පේෂල නිකලන්ද මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්.නිමල් කරුණාරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 08. ගරු නාගරික මන්ත්‍රිනී | පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය |
| 09. ගරු නාගරික මන්ත්‍රී | එන්.ඒ.එස් චන්දන මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රී | ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එස්.යූ.සී. ජයනක මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා |
| 14. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා |

**නිලධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්. එච්. ඒ. කරුණාරත්න මිය |

ගරු සභාපතිතුමන් විසින් මෙදින විශේෂ මහ සභාව සඳහා සහභාගි වූ ගරු නාගරික මන්ත්‍රීවරුන් ඇතුළු සියළුම දෙනා පිළිගනිමින් ගරු සභාවේ වැඩකටයුතු ආරම්භ කරන ලදි. අනතුරුව 2026 ජනවාරි 01 දින

සිට 2026 දෙසැම්බර් 31 දින දක්වා වර්ෂයක කාලයකට බළන්ගොඩ නගර සභාව සතු පහත දේපළ බදුදීම වෙනුවෙන්ද,

- පොදු වෙළඳසැළ අංක 09,10,11,12,14,18 දරණ මාළු කඩ ටෙන්ඩරය
- පොදු වෙළඳසැළ අංක 15 දරණ එළු මස් කඩ කාමරය, අංක 16 දරණ එළ හරක් මස් කඩ කාමරය, අංක 17 දරණ කුකුළු මස් කඩ කාමරය යන ටෙන්ඩරය
- පොදු වෙළඳසැළ අංක 05 දරණ එළවළු කඩ කාමරය ටෙන්ඩරය
- බළන්ගොඩ නගරයට රථ වාහන ඇතුළු කිරීමේ හා නැවතුම් ගාස්තු අයකිරීමේ ටෙන්ඩරය

2025.11.01 දින සිට 2026.10. 31 දින දක්වා වර්ෂයක කාලයකට බළන්ගොඩ නගරයේ කසළ ඉවත් කිරීම සහ පිරිසිදු කර පවත්වා ගෙන යාමේ ටෙන්ඩරය සඳහා සුදුසු බදුකරුවන් තෝරාපත්කර ගැනීම වෙනුවෙන් මෙදින විශේෂ මහ සභාව පවත්වන බව ගරු සභාපතිතුමා පවසන ලදී.

අනතුරුව ටෙන්ඩර් මණ්ඩල රැස්වීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්කරන ලදි.

ටෙන්ඩර් පත් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කර ගන්නා ලදි.

ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ලද පහත සඳහන් තීරණ සියල්ල ගරු සභාපතිතුමන් විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදි.

- පොදු වෙළඳසැළ අංක 09 දරණ මාළු කඩ කාමරය සඳහා ටෙන්ඩර් අයදුම්පත්‍ර එකක් නිකුත් කර තිබූ අතර එම ලංසුපත ලැබී තිබුණි.එහිදී ජී.ඩබ්.සිරිපාල ද සිල්වා මහතා විසින් ඉදිරිපත් කර තිබූ රු.24,550.00 ක ලංසු මුදල එම මහතා විසින් පිළිගනු ලැබීය.අනතුරුව ජී.ඩබ්.සිරිපාල ද සිල්වා මහතා වෙත ටෙන්ඩරය ලබා දීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.
- පොදු වෙළඳසැළ අංක 10 දරණ මාළු කඩ කාමරය සඳහා ටෙන්ඩර් අයදුම්පත්‍ර එකක් නිකුත් කර තිබූ අතර එම ලංසුපත ලැබී තිබුණි.එහිදී ජී.ඩබ්.සිරිපාල ද සිල්වා මහතා විසින් ඉදිරිපත් කර තිබූ රු.24,550.00 ක ලංසු මුදල එම මහතා විසින් පිළිගනු ලැබීය.අනතුරුව ජී.ඩබ්.සිරිපාල ද සිල්වා මහතා වෙත ටෙන්ඩරය ලබා දීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.
- පොදු වෙළඳසැළ අංක 11 දරණ මාළු කඩ කාමරය සඳහා ටෙන්ඩර් අයදුම්පත්‍ර එකක් නිකුත් කර තිබූ අතර එම ලංසුපත ලැබී තිබුණි.එහිදී එම්.එස් මැණික් විජේතුංග මහතා විසින් ඉදිරිපත් කර තිබූ රු.24,600.00 ක ලංසු මුදල එම මහතා විසින් පිළිගනු ලැබීය.අනතුරුව එම්.එස් මැණික් විජේතුංග මහතා වෙත ටෙන්ඩරය ලබා දීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

- පොදු වෙළඳසැළ අංක 12 දරණ මාළු කඩ කාමරය සඳහා ටෙන්ඩර් අයදුම්පත්‍ර එකක් නිකුත් කර තිබූ අතර එම ලංසුපත ලැබී තිබුණි.එහිදී එම්.කේ මුතුමාල මහතා විසින් ඉදිරිපත් කර තිබූ රු.24,600.00 ක ලංසු මුදල එම මහතා විසින් පිළිගනු ලැබීය.අනතුරුව එම්.කේ මුතුමාල මහතා වෙත ටෙන්ඩරය ලබා දීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.
- පොදු වෙළඳසැළ අංක 14 දරණ මාළු කඩ කාමරය සඳහා ටෙන්ඩර් අයදුම්පත්‍ර එකක් නිකුත් කර තිබූ අතර එම ලංසුපත ලැබී තිබුණි.එහිදී අයි.කේ මුතුමාල මහතා විසින් ඉදිරිපත් කර තිබූ රු.24,600.00 ක ලංසු මුදල එම මහතා විසින් පිළිගනු ලැබීය.අනතුරුව අයි.කේ මුතුමාල මහතා වෙත ටෙන්ඩරය ලබා දීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.
- පොදු වෙළඳසැළ අංක 18 දරණ මාළු කඩ කාමරය සඳහා ටෙන්ඩර් අයදුම්පත්‍ර 02 ක් නිකුත් කර තිබූ අතර එම ලංසු මුදල් පහත පරිදි ලැබී තිබුණි.

  1.ඉෂාන් කවිඳු මුතුමාල රු.36,550.00

  2.ප්‍රියන්ත ලාල් මුතුමාල රු.36,600.00

  ඒ අනුව වැඩිම ලංසු මුදල ඉදිරිපත් කළ ප්‍රියන්ත ලාල් මුතුමාල මහතා විසින් ඉදිරිපත් කර තිබූ රු.36,600.00 ක ලංසු මුදල එම මහතා විසින් පිළිගනු ලැබීය.අනතුරුව ප්‍රියන්ත ලාල් මුතුමාල මහතා වෙත ටෙන්ඩරය ලබා දීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

- පොදු වෙළඳසැළ අංක 15 දරණ එළු මස් කඩ කාමරය සඳහා ටෙන්ඩර් අයදුම්පත්‍ර 03 ක් නිකුත් වී අයදුම්පත් 02 ක් ලැබී තිබූ අතර එම ලංසු මුදල් පහත පරිදි ලැබී තිබුණි.

  1.අබ්දුල් මුන්තාලිෆ් මොහොමඩ් රෙමීෂින් රු.24,750.00

  2.අබ්දුල් රෂීඩ් මොහොමඩ් මිර්ෂාද් රු.40,000.00

  ඒ අනුව වැඩිම ලංසු මුදල ඉදිරිපත් කළ අබ්දුල් රෂීඩ් මොහොමඩ් මිර්ෂාද් මහතා විසින් ඉදිරිපත් කර තිබූ රු.40,000.00 ක ලංසු මුදල එම මහතා විසින් ප්‍රත්ක්ෂේප කළ බැවින් ඇප තැන්පත් සභාව සතු කිරීමටත්, අනතුරුව අබ්දුල් මුන්තාලිෆ් මොහොමඩ් රෙමීෂින් මහතා ඉදිරිපත් කළ රු.24,750 ලංසු මුදල එම මහතා පිළිගැනීමෙන් පසුව එම මහතා වෙත ටෙන්ඩරය ලබා දීමටත්, අබ්දුල් කාදර් රිස්වි මොහොමඩ් මහතා අයදුම්පත ඉදිරිපත් කර නොතිබූ බැවින් ඇප තැන්පත් සභාව සතු කිරීමටත් ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.
- පොදු වෙළඳසැළ අංක 16 දරණ ගව මස් කඩ කාමරය සඳහා ටෙන්ඩර් අයදුම්පත්‍ර 04 ක් නිකුත් කර තිබූ අතර එම අයදුම්පත් 04ම ලැබී තිබිණි.අබ්දුල් කාදර් රිස්වි මොහොමඩ් සහ මොහොමදු ජමීල් මොහොමඩ් දමීර් විසින් ඉදිරිපත් කර තිබූ අයදුම්පත්වල අවශ්‍ය

ලේඛන අමුණා නොතිබුණු බැවින් ටෙන්ඩර් මණ්ඩලය එය ප්‍රතික්ෂේප කරන ලද අතර ටෙන්ඩර් ඇප සභාව සතු කිරීමෙන් පසු පහත පරිදි ඉතිරි අයදුම්පත්‍ර 02 පිළිගනු ලැබීය.

1.පලීල් මොහොමඩ් රවුෂාන් රු.499,000.00
2.අබ්දුල් රෂීඩ් මොහොමඩ් මිර්ෂාද් රු.600,000.00

ඒ අනුව වැඩිම ලංසු මුදල ඉදිරිපත් කළ අබ්දුල් රෂීඩ් මොහොමඩ් මිර්ෂාද් මහතා විසින් ඉදිරිපත් කර තිබූ රු.600,000.00 ක ලංසු මුදල එම මහතා විසින් ප්‍රතික්ෂේප කළ බැවින් ඇප තැන්පත් සභාව සතු කිරීමටත්, අනතුරුව දෙවන ලංසු මුදල ඉදිරිපත් කළ පලීල් මොහොමඩ් රවුෂාන් මහතා ඉදිරිපත් කළ රු.499,000.00 ලංසු මුදල එම මහතා පිළිගැනීමෙන් පසුව එම මහතා වෙත ටෙන්ඩරය ලබා දීමටත් ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

- පොදු වෙළඳසැළ අංක 17 දරණ කුකුළු මස් කඩ කාමරය සඳහා ටෙන්ඩර් අයදුම්පත්‍ර 04 ක් නිකුත් කර තිබූ අතර එම අයදුම්පත් 03ක් ලැබී තිබිණි. ඉන් අබ්දුල් කාදර් රිස්වි මොහොමඩ් විසින් අයදුම්පත් ඉදිරිපත් කර නොතිබූ අතර ඊට අදාළ ටෙන්ඩර් ඇප සභාව සතු කිරීමට සභාව තීරණය කරන ලදී.ඉතිරි අයදුම්පත් පහත පරිදි ලැබී තිබිණි.

  1.ජමල්දීන් මොහොමඩ් ඉලයාස් රු.46,000.00
  2.ජමල්දීන් අබ්දුල් හමීඩ් රු.31,000.00
  3.රසුල්දීන් මොහොමදු ඉෆ්ලාල් රු.26,000.00

  ඒ අනුව වැඩිම ලංසු මුදල ඉදිරිපත් කළ ජමල්දීන් මොහොමඩ් ඉලයාස් මහතා විසින් ඉදිරිපත් කර තිබූ රු.46,000.00 ක ලංසු මුදල බාරගැනීම එම මහතා විසින් ප්‍රත්ක්ෂේප කළ බැවින් ඇප තැන්පත් සභාව සතු කිරීමටත්, අනතුරුව දෙවන ලංසු මුදල ඉදිරිපත් කළ ජමල්දීන් අබ්දුල් හමීඩ් මහතා ඉදිරිපත් කළ රු.31,000.00 ලංසු මුදල එම මහතා විසින්ද ප්‍රත්ක්ෂේප කළ බැවින් ඇප තැන්පත් සභාව සතු කිරීමටත්, අනතුරුව ඊළඟ ලංසු මුදල ඉදිරිපත් කළ රසුල්දීන් මොහොමදු ඉෆ්ලාල් මහතා ඉදිරිපත් කළ රු.26,000.00 ලංසු මුදල එම මහතා පිළිගැනීමෙන් පසුව එම මහතා වෙත ටෙන්ඩරය ලබා දීමටත් ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.
- 2025.11.01 දින සිට 2026.10.31 වන දින දක්වා බළන්ගොඩ නගරය පිරිසිදු කිරීම,කසළ ඉවත් කිරීම සහ බැංකියවත්ත ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානය දක්වා ප්‍රවාහනය කිරීම සඳහා සුදුසු බදුකරුවෙකු තෝරා පත් කර ගැනීම වෙනුවෙන් ලංසුපත් කැඳවූ අතර සභාව මගින් ඉදිරිපත් කළ අවම ලංසු මුදල රු.1,162,000.00 කි.මෙහිදී

ලංසුපත් 01 ක් පමණක් නිකුත් වී තිබූ අතර කේ.වාමලී ඉරේෂා මිය ඉදිරිපත් කළ ලංසු මුදල රු.1,335,000.00 කි.සභාවේ ලංසු මුදලට වඩා ලංසුකරුගේ ලංසුව වැඩි බැවින් සභාවේ ලංසු මුදල පිළිගන්නා ලෙස ටෙන්ඩර් මණ්ඩලය ඉල්ලීමක් කරන ලදී.නමුත් විවෘත කාණු පිරිසිදු කිරීම ටෙන්ඩරය වෙත ඇතුළත් කර ඇති බැවින් ඒ සඳහා කම්කරුවන් අතිරේකව 05 දෙනෙකු පමණ යෙදවීමට සිදුවන බැවින් සභාවේ මුදලට එකඟ විය නොහැකි බව ටෙන්ඩර්කරු දන්වන ලදී.අනතුරුව ලංසු මුදල සම්බන්ධව ඇතිවූ දීර්ඝ සාකච්ඡාවෙන් පසු රු.1,250,000.00 ක මුදලකට ටෙන්ඩරය පිළිගැනීමට ලංසුකරු සහ ටෙන්ඩර් මණ්ඩලය එකඟ වී එම මුදල යටතේ කේ.වාමලී ඉරේෂා මිය වෙත ටෙන්ඩරය ලබා දීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

- 2025 ඔක්තෝම්බර් මස 01 වන දින සිට ඉදිරි වසරක කාලයකට පොදු වෙළඳසැළ අංක 05 දරණ එළවළු කඩ කාමරය සඳහා සුදුසු බදුකරුවන් තෝරා පත් කර ගැනීම වෙනුවෙන් ටෙන්ඩර් අයදුම්පත්‍ර 04 ක් නිකුත් කර තුනක් ලැබී තිබූ අතර ලංසු මුදල් පහත පරිදි ලැබී තිබුණි.

  1.කේ.වී දම්මික හෂාන් විජේතිලක රු.12,720.00

  2.එම්.එම්.ටිකිරි බණ්ඩාර රු.12,500.00

  3.එස්.ඒ දිමුතු දසන්ත රු.13,600.00

  ඒ අනුව වැඩිම ලංසු මුදල ඉදිරිපත් කළ එස්.ඒ දිමුතු දසන්ත මහතා විසින් ඉදිරිපත් කර තිබූ රු.13,600.00 ක ලංසු මුදල එම මහතා විසින් පිළිගනු ලැබීමෙන් අනතුරුව එම මහතා වෙත ටෙන්ඩරය ලබා දීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

- බළන්ගොඩ නගරයට රථ වාහන ඇතුළු කිරීමේ හා නැවතුම් ගාස්තු අය කර පවත්වාගෙන යාම සඳහා ටෙන්ඩර් පත් 02 ක් නිකුත් කර තිබූ අතර පහත පරිදි ලංසුපත් ලැබී තිබුණි.

  1.එල්.ඒ නිමල් සෝමරත්න රු.181,110.00

  2.ඩබ්.එල්.තුෂාර රවිනාත් ලියනගේ රු.160,150.00

  එහිදී වැඩිම ලංසු මුදල ඉදිරිපත් කළ එල්.ඒ නිමල් සෝමරත්න මහතා විසින් ඉදිරිපත් කළ රු.181,110.00 ලංසු මුදල එම මහතා පිළිගැනීමෙන් පසුව එම මහතා වෙත ටෙන්ඩරය ලබාදීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදි.

ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ලද ඉහතින් ලබාගන්නා තීරණ සියල්ල ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරමින් ගරු සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට කළ යෝජනාව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය හා කාර්ය මණ්ඩලය සඳහා ස්තූතිය පුදකරමින් පෙ.ව 11.50 ට පමණ විශේෂ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදී.

**කේ. ජී.පේමදාස,**

සභාපති,

බළන්ගොඩ නගර සභාව.